සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 4

විෂය - බුද්ධ ධර්මය | ශ්‍රේණිය - 5 | 2021ඔක්තෝබර් මාසය

සැකසුම : තමරා දර්ශනී මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 18.සිල් පිරිසට උවටැන් කරමු.

ආදරණීය දුවේ පුතේ ඔයාලට මතකද අපි පසුගිය පාඩමකදී සිල සමාදාන වැඩ සටහනක් ගැන කතා කළා.අදත් අපි ඒ වගේ දෙයක් ගැන කතා කරන්නයි යන්නේ.ඔයාලගේ බුද්ධ ධර්මය පොත අරගෙන 18 වන පාඩම ගෙදර හැමෝටම ඇහෙන්න කියවන්නකෝ.

දැන් එහෙනම් අපි මේ ප්‍රශ්න ටිකට උත්තර ලියමු.

1.පහත වචන ගැළපෙන සේ යා කරමු .

| | |
|---|---|
| ❖ ඇඳුරු මඩුල්ල | ඖෂධීය පාන |
| ❖ හීල් දානය | උණුසුම් වතුර |
| ❖ ඔසු පැන්. | උදේ ආහාරය |
| ❖ උවැසු උවැසියන් | ගුරු මණ්ඩලය |
| ❖ උණු පැන් | උපාසක උපාසිකාවන් |

2.අපි දැන් මේ ප්‍රශ්න ටිකට උත්තර ලියමු පුතේ.

- පාඩමේ කියවෙන්නේ කුමන පොහොය දිනයක් ගැනද?
- පොහොය දිනයේ දහම් පාසලේ දරුවන්ට පැවරුනු කටයුත්ත කුමක්ද?
- සිල් සමාදන් වූ පිරිසට ඇප උපස්ථාන කළ හැකි වතාවත් 2ක් ලියන්න.
- සිල් සමාදන් වූ අයට ඖෂධීය පානය පූජා කිරීමේ ආනිසංසයක් ලියන්න.

ඔබත් පොහොය දිනයට සිල් සමාදන් වූ අයට ඇප උපස්ථාන කර පින් රැස් කර ගන්න.